


**Revision** ඇගයීම් අංක - **19**

විනාඩි 30 කි
30 Minutes

01. ආර්ථිකයක ප්‍රාග්ධන තොගය **ඉහළ නැංවීමට** අදාළ ක්‍රියාව කුමක් ද ?
    (1) ආයතනයක් තම ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම.
    (2) රුපියල් මිලියනයක සමාගම් කොටස් මිල දී ගැනීම.
    (3) පුද්ගලයෙකු තම ඉතුරුම් භාවිතා කරමින් නව මෝටර් රථයක් මිල දී ගැනීම.
    (4) ආයතනයක අලෙවිය සඳහා තබා ඇති ආනයනය කරන ලද පරිගණක තොගය.
    (5) පුද්ගලයෙකු තමාගේ පදිංචිය සඳහා නව නිවසක් ඉදි කිරීම.

02.




මෙම නිෂ්පාදන හැකියා රූප සටහන පෙන්නුම් කරන සූක්ෂම ආර්ථික විද්‍යාත්මක ගැටළුව කුමක් ද ?
(1) නිෂ්පාදන සංයෝගය A සිට B දක්වා වෙනස් කරන්නේ කෙසේ ද ?
(2) නිෂ්පාදන සංයෝගය C සිට A දක්වා වෙනස් වීමට හේතු කවරේ ද ?
(3) නිෂ්පාදන සංයෝගය B සිට C දක්වා වෙනස් කළ යුතු ද ? නැතිනම් B සිට D දක්වා වෙනස් කළ යුතු ද ?
(4) නිෂ්පාදන මායිම PP සිට $P_1P_1$ දක්වා වෙනස් කරන්නේ කෙසේ ද ?
(5) $P_1P_1$ නිෂ්පාදන හැකියා මායිම PP දක්වා වමට විතැන්වීමට හේතු කවරේ ද ?

03. අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී එක්තරා භාණ්ඩයක් පරිභෝජනය කරන පිරිසකගේ සාමාන්‍ය ආදායම ඉහළ යාමේ ප්‍රතිඵලය ලෙස එම භාණ්ඩයේ සමතුලිත මිල අඩු වීමක් වාර්තා වේ. මෙම භාණ්ඩය,
    (1) බාල භාණ්ඩය කි.
    (2) සුඛෝපභෝගී භාණ්ඩය කි.
    (3) අත්‍යවශ්‍ය භාණ්ඩය කි.
    (4) ආදේශන භාණ්ඩය කි.
    (5) අනුපූරක භාණ්ඩය කි.

04. මිල ඉල්ලුම් නම්‍යතාවෙන් මනිනු ලබන්නේ,

(1) ඉල්ලුම තීරණය කරන සාධකයක වෙනසට ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරය යි.

(2) භාණ්ඩයක මිලෙහි සාපේක්ෂ වෙනසකට ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරය යි.

(3) යම් භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය වෙනත් භාණ්ඩයක මිලෙහි ඇතිවන වෙනසකට දක්වන ප්‍රතිචාරය යි.

(4) නිෂ්පාදන සාධකයක මිලෙහි ඇතිවන සාපේක්ෂ වෙනසකට ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරය යි.

(5) මිලෙහි සාපේක්ෂ වෙනසකට ඉල්ලුම් ප්‍රමාණයේ ඇතිවන ඉහළ යාම යි.

05. පාරිභෝගික භාණ්ඩයක මිල රු. 5 දී ඉල්ලුම් ප්‍රමාණය 300 ක් ද, ඉල්ලුම් නම්‍යතාව - 1/3 ක් ද වේ. මෙම භාණ්ඩයේ මිල රු. 15 ක් වන විට ඉල්ලුම් නම්‍යතාව වනුයේ,

(1) - 3 කි. (2) -0.5 කි. (3) -0.6 කි. (4) -1.0 කි. (5) -2.0 කි.

06. භාණ්ඩයක මිල ඉහළ යන විට එම භාණ්ඩය මත කෙරෙන පරිභෝජන වියදම අඩු වේ. මෙවැන්නක් සිදුවිය හැක්කේ,

(1) භාණ්ඩය අත්‍යවශ්‍ය භාණ්ඩයක් වන විට දී ය.

(2) භාණ්ඩය බාල භාණ්ඩයක් වන විට දී ය.

(3) භාණ්ඩයට සමීප ආදේශක බහුලව පවතින විට දී ය.

(4) භාණ්ඩයෙන් ලැබෙන ප්‍රයෝජන සංඛ්‍යාව ඉතා විශාල වන විට දී ය.

(5) භාණ්ඩයට ඇති සැපයුම අනම්‍ය වන විට දී ය.

07. තරඟකාරී තේ වෙළෙඳ පොළ පිළිබඳ පහත විස්තර ඔබට සපයා ඇත.

කෝපි මිල සමඟ හරස් ඉල්ලුම් නම්‍යතාව 1.5

සීනි මිල සමඟ හරස් ඉල්ලුම් නම්‍යතාව - 2.5

කෝපි මිල හා සීනි මිල යන දෙක ම 10% කින් වැඩි වූයේ නම්,

(1) තේ ඉල්ලුමට බලපෑමක් නැත.

(2) තේ ඉල්ලුම 10% කින් වැඩි වේ.

(3) තේ ඉල්ලුම 10% කින් අඩු වේ.

(4) තේ ඉල්ලුම 35% කින් වැඩි වේ.

(5) තේ ඉල්ලුම 35% කින් අඩු වේ.

08. ජංගම දුරකථන සමාගමක් හඳුන්වා දුන් 'අභිමාන' නම් විශේෂ පැකේජය සඳහා ග්‍රාහකයෝ මිලියනයක් සිටිති. මාසික ගාස්තුව රුපියල් 100 ක් වන එම පැකේජයෙහි මිල ඉල්ලුම් නම්‍යතාව -4.0 ක් ලෙස සමාගම විසින් ඇස්තමේන්තු කොට ඇත. 'අභිමාන' පැකේජයේ මාසික ගාස්තුව රුපියල් 25 කින් අඩු කරනු ලැබුවහොත් සමාගමේ මුළු අයභාරය.

(1) රුපියල් මිලියන 100 කින් ඉහළ නගී.

(2) රුපියල් මිලියන 75 කින් ඉහළ නගී.

(3) රුපියල් මිලියන 50 කින් ඉහළ නගී.

(4) රුපියල් මිලියන 50 කින් පහළ වැටේ.

(5) රුපියල් මිලියන 100 කින් පහළ වැටේ.

09. ජංගම දුරකථන වෙළෙඳ පොළේ A, B, C, D හා E යන ජංගම දුරකථනවල මිල හා සම්බන්ධ කරමින් ගණනය කරන ලද X නැමැති ජංගම දුරකථන වර්ගයේ හරස් ඉල්ලුම් නම්‍යතාව පහතින් දැක් වේ.

| **භාණ්ඩය** | **හරස් ඉල්ලුම් නම්‍යතාව** |
|---|---|
| A | 0.6 |
| B | 1.0 |
| C | 2.1 |
| D | 0.2 |
| E | 3.2 |

X නැමැති ජංගම දුරකථනයට **අඩුම** තරගකාරීත්වයක් පෙන්නුම් කරනුයේ,

(1) A මගින් (2) B මගින් (3) C මගින් (4) D මගින් (5) E මගින්

10. පාරිභෝගික සමීක්ෂණයට අනුව, ආදායම 12% කින් වැඩි කරනු ලැබුවහොත්, නාගරික ජනතාව කුකුල් මස් සඳහා කරන ඉල්ලුම 6% කින් වැඩි කරන බවත්, ග්‍රාමීය ජනතාව කුකුල් මස් සඳහා කරන ඉල්ලුම 4% කින් අඩු කරන බවත්, අනාවරණය වී ඇත. මේ මගින් නිගමනය කළ හැක්කේ,

(1) කුකුල් මස්, නාගරික ජනතාවට බාල භාණ්ඩයක් හා ග්‍රාමීය ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩයක් වන බව ය.

(2) කුකුල් මස්, නාගරික ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩයක් හා ග්‍රාමීය ජනතාවට සුඛෝපභෝගී භාණ්ඩයක් වන බව ය.

(3) කුකුල් මස් නාගරික ජනතාවට සුඛෝපභෝගී භාණ්ඩයක් හා ග්‍රාමීය ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩයක් වන බව ය.

(4) කුකුල් මස් නාගරික ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩයක් හා ග්‍රාමීය ජනතාවට බාල භාණ්ඩයක් වන බව ය.

(5) කුකුල් මස් නාගරික ජනතාවට සුඛෝපභෝගී භාණ්ඩයක් හා ග්‍රාමීය ජනතාවට බාල භාණ්ඩයක් වන බව ය.

සැකසුම ඃ බණ්ඩාර දිසානායක
B.Sc.(Mgt)Sp